කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2016

ජනවාරි/ පෙබරවාරි - 2022

**BMGT E 1045 - ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

අ) මානව අයිතිවාසිකම් සහ මූලික අයිතිවාසිකම් අතර වෙනස්කම් පෙන්වා දෙන්න.

(ලකුණු 06)

ආ) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් හතරක් (04) නම් කරන්න.

(ලකුණු 04)

ඇ) මාතර පදිංචි එක්තරා කුලයකට අයත් ධීවරයන් පිරිසක් ප්‍රකාශ කළේ මාතර, මෝදර වැල්ල ප්‍රදේශයේ මසුන් ඇල්ලීම සඳහා තම කුලයට අයත් ධීවරයන්ට පමණක් අයිතිය ඇති බවයි. මෙම සිරිත, නීතියක් වශයෙන් පිළිගැනීම උදෙසා අධිකරණය විසින් සලකා බලන කරුණු මොනවාදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) වලංගු ගිවිසුමක තිබිය යුතු මූලිකාංග 05 ක් නම්කොට කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) දනුෂ්ක, සිය නිවස ප්‍රියන්ත වෙත රු. මිලියන 10 කට විකිණීම සඳහා අර්පනයක් ඉදිරිපත් කරයි. තවදුරටත් එම අර්පණය 2021, ජනවාරි 31. දින උදේ 10 දක්වා විවෘත බවත් දන්වා සිටියි. නමුත් 2021, ජනවාරි 30, දනුෂ්ක එම නිවස අරුණට විකුණයි. අරුණගේ සහ ප්‍රියන්තගේ මිතුරෙකු වන බිමල් මෙම විකිණීම පිළිබඳව ප්‍රියන්ත වෙත එදිනම දන්වා සිටියි. කෙසේ වෙතත් ප්‍රියන්ත සිය ප්‍රතිග්‍රහණය සහිත ලිපිය දනුෂ්ක වෙත ජනවාරි 31, උදේ 10 ට පෙර භාර දෙයි. ප්‍රියන්තට, දනුෂ්කට එරෙහිව ගිවිසුම් කඩකිරීම පිළිබඳව නීතිමය පියවර ගැනීමට අවශ්‍යව ඇත. ප්‍රියන්තට උපදෙස් දෙන්න. ඔබගේ පිළිතුර සනාථ කිරීමට විනිශ්චිත නඩුතීන්දු පෙන්වා දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) ජයලත් කොවිඩ් 19 රෝගය සඳහා ඖෂධයක් නිපදවූ අතර, ඔහු පුවත්පත් සහ සමාජ මාධ්‍ය ජාල හරහා එම ඖෂධය ප්‍රචාරය කරමින් කියා සිටියේ යම් කෙනෙකු එම ඖෂධය දිනකට තුන් වතාව බැගින් පුරා සති 02 ක් පාවිච්චි කොට කොවිඩ් රෝගය වැලදුනහොත් තමා එම තැනැත්තාට රු. ලක්ෂයක මුදල් ත්‍යාගයක් පිරිනමන බවයි. ඔහු තවදුරටත් පැවසුවේ දැනටමත් ලංකා බැංකුවේ ගිණුමක රු. 500,000 එම කර්තව්‍ය සඳහා තැන්පත් කොට ඇති බවයි. ගයා මෙම පුවත්පත් දැන්වීම දැක අදාල ඖෂධය මිලදී ගෙන උපදෙස් දී ඇති පරිදි පාවිච්චි කළත් අවසානයේ ඇයට කොවිඩ් 19 රෝගය වැලදුනි. ඇය තමාට හිමි ත්‍යාගය, ජයලත් වෙතින් ඉල්ලා සිටියත්, ඔහු එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් පවසා සිටියේ ගයා සහ තමා අතර ගිවිසුමක් නොමැති බවත්, තමා අදාල පුවත්පත් දැන්වීම පල කළේ හුදෙක් විකුණුම් ප්‍රවර්ධනය පිණිස බවත්ය. ගයාට මුදල් ත්‍යාගය ලබාගත හැකිද? විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) වලංගු ගිවිසුමක් සෑදීම සඳහා මූලිකාංගයක් වශයෙන්, පාර්ශ්වයන් අතර නිසි කැමැත්ත තිබිය යුතුය. මෙම නිසි කැමැත්ත යම් හේතූන් නිසා හානියට පත්වේ.
එම හේතූන් මොනවාදැයි නම් කොට කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

ආ) නෙමෝ ඩාට් කොඩ් නොන් හබෙට් (***Nemo dat quod non habet***) යන රීතියෙන් අදහස් වන්නේ තමාට නොමැති අයිතියක් තවත් අයෙකුට ලබා දිය නොහැකි බවයි. නමුත් මෙම රීතියට අදාල ව්‍යාතිරේඛ පවතියි. ඒවායින් 05 ක් සුදුසු නිදසුන් සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) බෝට්ටු විකුණන්නෙකු වන රසල්, අඩි 19 ක් දිග බෝට්ටුවක් රු. 150,000/= කට රොබට් වෙත විකිණීම සඳහා ගිවිසුමකට එළඹේ. එම එකඟත්වයට අනුව මුලින් රු. 25,000/= ක අත්තිකාරම් මුදලක් දිය යුතු අතර ඉතිරි මුදල බෝට්ටුව භාර දෙන අවස්ථාවේ ලබා දිය යුතුය. අදාල එකඟත්වයට අනුව නව එන්ජින් යන්ත්‍රයක් ඊට සවි කිරීම සඳහා රසල් පොරොන්දු විය. එම බෝට්ටුව රසල්ගේ සන්තකයේ පවතින අවස්ථාවේදී ගින්නකට හසු වී විනාශයට පත්විය. රසල්ගේ රක්ෂණ ආයතනය ඒ සඳහා වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කරමින් පවසා සිටියේ අනතුර සිදුවන අවස්ථාව වනවිට එම බෝට්ටුවේ හිමිකරු රසල් නොවන බවයි. අනතුර සිදුවන අවස්ථාව වන විට රසල්ට ඒ සඳහා අයිතියක් පැවතියේදැයි භාණ්ඩ විකිණීමේ නීතිය වෙත අවධානය යොමු කරමින් විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

ආ) අමිල සහ බිමල් හවුල් ව්‍යාපාරයක් වශයෙන් සිනමා ශාලාවක් පවත්වා ගෙන යයි. අදාල හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුව, යම් හවුල්කරුවෙකුට ණය ලබාගත හැක්කේ එක්කෝ අනෙක් හවුල්කරුගේ කැමැත්ත මතය. නැතිනම් ව්‍යාපාර කටයුතු සඳහාය. අමිල, රු. මිලියනයක මුදලක් චන්දන වෙතින් ණය පදනම මත බිමල්ට නොදන්වා ලබා ගත් අතර එම මුදල් තම පෞද්ගලික කාරණා සඳහා යොදා ගනිමින් අවභාවිතා කරන ලදී. එම මුදල් නැවත ලබාගැනීම සඳහා චන්දන, බිමල්ට එරෙහිව නඩු පැවරීය. චන්දනට අදාල මුදල, බිමල් වෙතින් ලබාගත හැකිද?

(ලකුණු 08)

ආ) විශේෂ අවස්ථා යටතේ, නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් හවුල්කරුවෙකු හවුල් ව්‍යාපාරයකින් නෙරපා දැමිය හැකිය. හවුල්කරුවෙකු නෙරපීමට සපුරාලිය යුතු කොන්දේසි මොනවාදැයි දක්වන්න.

(ලකුණු 06)

ඇ)  අධිකරණයේ මැදිහත්වීම මත හවුල් ව්‍යාපාරයක් විසුරුවාලන අවස්ථා මොනවාද?

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

අ)  ගණුදෙනු කළ හැකි ලියවිල්ලකට අදාල මූලික ලක්ෂණ මොනවාද?

(ලකුණු 05)

ආ)  "චෙක්පතක සැමවිටම අණලාභියා වන්නේ බැංකුකරුවෙකි. එසේම අණකරුගේ ගිණුමේ ප්‍රමාණවත් මුදල් තිබේ නම් අදාල මුදල ගෙවනු ලැබේ." බැංකුකරුවෙකු චෙක්පතකට මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරන අවස්ථා 05 ක් දක්වන්න.

(ලකුණු 05)

ඇ)  සමන් සහ රොෂාන් යන දෙදෙනා හොඳ මිතුරන් වූ අතර දෙදෙනා සිය පවුල් උදෙසා රක්ෂණ ආවරණ ලබා ගැනීමට අවශ්‍ය විය. සමන්, සිය ජීවිතය සහ බිරිඳ වූ පවනිගේ ජීවිත වෙනුවෙන් රක්ෂණ ඔප්පු දෙකක් මිලදී ගැනීමට අපේක්ෂා කළේය. නමුත් සමන්, සිය බිරිඳ උදෙසා රක්ෂණ ආවරණය ලබා ගැනීමේ ඉල්ලුම්පත සම්පූර්ණ කිරීමේදී, ඇය කුඩා කළ සිට හෘද රෝගයකින් පෙළෙන බැව් සඳහන් කළේ නැත. රොෂාන් තනිකඩයෙකු වූ අතර, ඔහු සිය වාහනය සහ තම වැඩිමහල් සොහොයුරිය වන ප්‍රියාගේ ජීවිත සඳහා රක්ෂණ ඔප්පු ලබාගැනීමට අයදුම් කළේය. රක්ෂණ ආයතනය රොෂාන්ගේ සොහොයුරියගේ ජීවිතය රක්ෂණය සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කළ අතර සමන්ගේ බිරිඳ උදෙසා ඉදිරිපත් කළ අයදුම්පත පිළිගත්තේය.

මෙසේ රොෂාන්ගේ සොහොයුරියගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමටත්, සමන්ගේ බිරිඳගේ අයදුම්පත පිළිගැනීමටත්, අදාල වූ කාරණා විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

අ)  ජැෆ්නා ට්‍රේඩින් සමාගමේ නියෝජිතයෙකු වන සිවා, එම සමාගම වෙනුවෙන් පළතුරු තොගයක් කොළඹින් මිලදී ගත්තේය. යාපන ප්‍රදේශයේ අඛණ්ඩව පැවති ධාරානිපාත වර්ෂාව සහ ගංවතුර තත්ත්වය නිසා සිවා ට ඒවා අදාල ආයතනය වෙත යැවීමට නොහැකි වූ අතර, එම ආයතනය සමඟ සන්නිවේදනය කිරීමට ද නොහැකි විය. සිවා එම පළතුරු තොගය කොළඹදී අඩු මුදලකට

විකුණා අදාල මුදල ජැෆ්නා ට්‍රේඩින් ආයතනය වෙත යැවීය. තමාට සිදු වූ අලාභය සම්බන්ධයෙන් ජැෆ්නා ට්‍රේඩින් ආයතනය සිවාට එරෙහිව නඩු පැවරීමට අදහස් කරයි. සිවා මේ සම්බන්ධයෙන් වන්දි ගෙවිය යුතුදැයි විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් දක්වන්න.

(ලකුණු 10)

ආ) නියෝජිතයෙකු සතු යුතුකම් 05 ක් නම් කොට විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 08**

අ) රජරට සිමෙන්ති සමාගම, අනුරාධපුරයේ පිහිටා ඇති අතර එහි සේවකයන් 500 පමණ සේවයේ යෙදේ. ඊට අමතරව තවත් සේවකයන් 10 දෙනෙකු, පිරිසිදු කරන්නන් වශයෙන් එහි සේවය කරන අතර ඔවුන්ගේ රැකියාවේ ස්වභාවය පැහැදිලි නැත. මෙම සේවකයන් 10 දෙනා පසුගිය වසර තුනක් පුරාවට ආයතනයේ සේවය කරන අතර ඔවුන්ව එම සමාගම වෙත යොමු කර ඇත්තේ ABC ක්ලිනින් ආයතනයයි. ඔබ එම ආයතනයට සම්බන්ධ එක්සත් කර්මාන්ත සේවක සංගමයේ නීතිමය උපදේශක වශයෙන් කටයුතු කරයි. අදාල පිරිසිදු කරන්නන් දස දෙනා එම ආයතනයේ සේවකයන්ද නැතිනම් ස්වාධීන ගිවිසුම්කරුවන්දැයි තීන්දු කිරීමට ඔබට සිදු වී ඇත. උපදෙස් දීම සඳහා ඔබට වුවමනා කරන අමතර තොරතුරු කවරේද?

(ලකුණු 10)

ආ) කාර්මික ආරවුල් පනත මගින් පිළිගෙන ඇති කාර්මික ආරවුල් නිරවුල් කිරීමට අදාල ක්‍රම මොනවාදැයි නම් කොට කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**